# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 4 දරන
# ජාතික ශිල්ප සභාව සහ
# අනුබද්ධ ආයතන
# (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 පෙබරවාරි මස 08 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1996 පෙබරවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 2.00 යි.

# 1996 අංක 4 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1996 පෙබරවාරි මස 08 වන දින.]

**එල්. ඩී.—ඕ. 11/93**

අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශවල සේවයේ නියුක්තව සිටියා වූ ද ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් පසුව සේවයේ නියුක්ත කරනු ලැබුවා වූ ද ඇතැම් රජයේ නිලධරයන්ට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබාගත හැකි වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

මේ පනත 1996 අංක 4 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශවල සේවයේ නියුක්තව සිටියා වූ ද ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් පසුව සේවයේ නියුක්ත කරනු ලැබුවා වූ ද, ඇතැම් තැනැත්තන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වන්නා වූ සහ මණ්ඩලය යටතේ ඔහුගේ සේවය, අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශයක සේවයට එකතු කළවිට, එය අවුරුදු දහයක් හෝ ඊට වැඩි කාලසීමාවක් වන්නා වූ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වනවිට, 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යටතේ විශ්‍රාම වැටුපක් ලබන හෝ ගෙවනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු නොවන්නා වූද, අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශයේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ද ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සෑම නිලධරයකු ම හෝ සේවකයකු අදාළ සේවා කාලසීමාව තුළ එම තනතුර දරා ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ කාලසීමාව තුළ අවසානයේදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

“අදාළ සේවා කාලසීමාව” යන්න මේ වගන්තිය අදාළ වන තැනැත්තකු හා සම්බන්ධයෙන් යෙදෙන විට ඒ තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි, අත්කම් භාණ්ඩ අලෙවි සහ අපනයන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශයක හෝ දිගටම සේවය කරන ලද නම්, අවුරුදු දහයක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා ඒ තැනැත්තා මණ්ඩලයේ තනතුරකට පත් කරනු ලැබූ දිනයෙන් පසු එකී දෙපාර්තමේන්තුවේ නැතහොත් අදාළ අංශයේ සේවය කළයුතු විය හැකිව තිබුණු කාලසීමාව ඉන් අදහස් වේ.

2 ඞ 028018 6,130 (95/10)

*ප්‍රදානය කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි.*

3. 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලබන සෑම තැනැත්තකුට ම 'ඒ' විශ්‍රාම වැටුප ලැබිය යුත්තේ—

(අ) මණ්ඩලය යටතේ ස්ථිර සේවා නියුක්තිය භාර ගැනීමේ දී ඔහුට ගෙවන ලද යම් පාරිතෝෂිකයක්, ඔහු විසින් හෝ ඔහුගේ උරුමකරුවන් විසින්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ආපසු ගෙවීමට යටත්ව ය ; තව ද

(ආ) ඒ තැනැත්තා මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයෙන් ආරම්භව, මේ පනතේ 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුසුකම් ලැබූ හෝ සුදුසුකම් ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ඒ තැනැත්තා වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට මණ්ඩලය විසින් ගෙවන ලද සියලු දායක මුදල් කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ ඉහත කී තැනැත්තා සේවක අර්ථසාධක අරමුදලට ගෙවූ දායක මුදල් ලබාගෙන ඇත්නම් ඔහු විසින් නැතහොත් ඔහුගේ උරුමකරුවන් විසින් හෝ ආපසු ගෙවීමට යටත්ව ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අර්ථ නිරූපණය.*

5. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත මගින් පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල අදහස් වේ;

"කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අදාළ අංශ" යන්නෙන් 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ III වන කොටසේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.